# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1859/28 - 2014 අප්‍රේල් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2014.04.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය: ඇඹි/ප්‍රාලේ/ඉ/05/02/05.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය: 4/3/9/2012/WS/73.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :-*

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දියපොටගම් පත්තුව සුළු කොට්ඨාසයේ, පනාමුරේ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද, 2013.09.27 දිනැති ගම් පිඹුරු අංක 753 අතිරේක අංක 39 හා පත්‍ර අංක 39 දරන පිඹුරේ කැබලි අංක 1064, 1065 හා 1066 වශයෙන් දැක්වෙන 'කෝන්ගහහේන' සහ 'වෙහෙරගාවමූකලාන' නමැති ඉඩම්වලින්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0834ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් තුන:

**කැබලි අංක 1064 - ඉඩමේ නම: කෝන්ගහහේන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0151**

**මායිම්:**

*උතුරට*: කැබලි අංක 94, 1053, 402 සහ 1065; *නැගෙනහිරට*: කැබලි අංක 1053, 402 සහ1065; *දකුණට*: කැබලි අංක 1053; බටහිරට : කැබලි අංක 1053 සහ 94.

හිමිකම් කියන්නන්ගේ නම හා ලිපිනය : කේ. ඒ. හීන්හාමි මහත්මිය, මහ කඩේවත්ත, පනාමුරේ, ඇඹිලිපිටිය.

**කැබලි අංක 1065 - ඉඩමේ නම: වෙහෙරගාවමූකලාන - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0181**

**මායිම්:**

*උතුරට*: කැබලි අංක 402; *නැගෙනහිරට*: කැබලි අංක 402 සහ 1066; *දකුණට*: කැබලි අංක 1066, 402, 1053 සහ 1064; බටහිරට : කැබලි අංක 402, 1053 සහ 1064.

හිමිකම් කියන්නන්ගේ නම හා ලිපිනය : ආර්. කේ. ජයලත් මහතා, අංක 74/D, වැ අතුර, පනාමුරේ, ඇඹිලිපිටිය.

**කැබලි අංක 1066 - ඉඩමේ නම: වෙහෙරගාවමූකලාන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0502**

*උතුරට*: කැබලි අංක 1065 සහ 402; *නැගෙනහිරට*: කැබලි අංක 402; *දකුණට*: කැබලි අංක 402 සහ 1053; බටහිරට : කැබලි අංක 1053, 402 සහ 1065.

හිමිකම් කියන්නන්ගේ නම හා ලිපිනය : ආර්. කේ. ජයලත් මහතා, අංක 74/D, වැ අතුර, පනාමුරේ, ඇඹිලිපිටිය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 මැයි මස 28 වැනි දින පෙ. ව. 10.00ට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 මැයි මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි


1A - G 19437 - 90 - (2014/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත්කළ යුතු ය.

වසන්ත ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
ඇඹිලිපිටිය.

2014 අප්‍රේල් මස 21 වැනි දින,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-195

---

## ශුද්ධි පත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීම

1999 දෙසැම්බර් මස 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1109/21 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත සඳහන් දැන්වීමේ පිඹුරු අංක 3727 හි කැබලි අංක 56, ඉඩමේ නම - කහටගහවත්ත හිමිකම් කියන අය බර්නාඩ් පෙරේරා, ප්‍රමාණය හෙක්. 0.0062 (ව. මී. 62) ලෙස සඳහන් වී ඇතත් එය පූ 5098 මූලික පිඹුරේ කැබලි අංක 01, හිමිකම් කියන අය පී. රිචඩ් පෙරේරා, ප්‍රමාණය හෙක්. 0.0014 ද, කැබලි අංක 2, හිමිකම් කියන අය සොයාගත නොහැක, ප්‍රමාණය හෙක්. 0.0014 ද, කැබලි අංක 03 හිමිකම් කියන අය කේ. ඒ. පෙරේරා, ප්‍රමාණය හෙක්. 0.0034 ලෙස ද නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

එස්. එම්. එල්. චන්ද්‍රසිරි,
ප්‍රාදේශීය ලේකම්,
මහවැව.

මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 196

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.